# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2013.12.20 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

## 01. ප්‍රධාන විනයාරක්ෂක

**අවශ්‍ය සුදුසුකම්:**

i. (a) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම සහ ශ්‍රී ලංකා පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරී තනතුරක් දරන ලද හෝ ඊට ඉහළ තනතුරක් දරන නිලධාරියෙකු වීම හෝ ඊට සමාන තනතුරක් දරන ශ්‍රී ලංකා යුධ හමුදා සේවයේ නියුතු නිලධාරියෙකු වීම.

හෝ

(b) විශ්වවිද්‍යාල විනයාරක්ෂක සේවයේ නියුතු නියෝජ්‍ය ප්‍රධාන විනයාරක්ෂක තනතුර දරන හා එම තනතුරේ ස්ථිර වී වසර 05 ක පළපුරුද්දක් සහිත නිලධාරියෙකු වීම.

ii. ශාරීරික සුදුසුකම්:

උස අඩි 5 අඟල් 5 කට නොඅඩු විය යුතුය.

පපුව අඟල් 32 ක් (සාමාන්‍ය) විය යුතුය.

**සටහන:** විශ්වවිද්‍යාල මට්ටමේ හෝ ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුතුවල සමාජ සුභසාධන කටයුතුවල හා ක්‍රීඩා වැඩසටහන්වලදී ක්‍රියාකාරී ලෙස සහභාගි වී ඇති කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** රු.33,745 - 8×645; 8×790 - 45,225 - මාසික [ U - EX 2(II) ]

## 02. <u>සැපයීම් නිලධාරී (II ශ්‍රේණිය) තනතුර</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ අංක ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

ii. (a) රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක ගබඩා පාලනය සහ ඒ සම්බන්ධ වාර්තා පොත් පවත්වාගෙන යාම හෝ ඉංජිනේරු ආම්පන්න, විදුලි භාණ්ඩ, රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ සහ ලෝහ භාණ්ඩ උපකරණ මිලදී ගැනීම සහ හඳුනාගැනීම පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 15 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

හෝ

(b) පිළිගත් ආයතනයකින් පවත්වනු ලබන ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ දෑ අවුරුදු පාඨමාලාව හදාරා තිබීම හා ඉහත ii (a) යටතේ දැක්වෙන ක්ෂේත්‍රයන්හි වසර 10 ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** රු.19,470 - 18×245 - 23,880 - මාසික [ U-MN 2(II) ]

## 03. වැඩ පරිපාලක (සිවිල්) - කොන්ත්‍රාත් පදනම මත

**අවශ්‍ය සුදුසුකම්:**
තාක්‍ෂණය පිළිබඳ ජාතික සහතිකය (සිවිල්) හෝ සමාන සුදුසුකමක් සහිත තෙවර්ෂයක පළපුරුද්ද. තාක්‍ෂණය පිළිබඳව ජාතික සහතික පාඨමාලාව හදාරමින් අදාල පළපුරුද්ද ලබාගත හැකිය.

හෝ

රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක යටත් පිරිසෙයින් වසර 05 ක වැඩ පරිපාලක (සිවිල්) තනතුරේ පළපුරුද්දක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත් වී තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**දීමනා:** රු.22,470.00 (රු.16,070.00 + 6,600.00) - (මාසික)

## 04. හෙදි නිලධාරී (II ශ්‍රේණිය) තනතුර

**අවශ්‍ය සුදුසුකම්:**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය මඟින් පිළිගනු ලබන හෙදි යෝග්‍යතා සහතිකයක් තිබීම.

iii. වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** රු.16,535 - 7×155; 10×185 - 19,470.00 - (මාසික) U-MT 1 (IIIA)

අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ ආයතන අනධ්‍යයන අංශයට පැමිණ නියමිත ආකෘති පත්‍ර ලබාගත හැකිය. 2013.12.13 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් “ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර.” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම හා නියමිත දිනට පසුව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට මොනම හේතුවක් නිසා හෝ එම අයදුම්පත් නැවත සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම,
මාතර.
2013.11.21